පන්හිඳෙයි පින්සලයි

සිසිර දිසානායක

මුල මතක තියා ගන්න

"වර්ෂ දෙදහස් පහක් වූ ..... වැරදුණා , වැරදුණා ? දෙදහස් සයක් වූ ..... '' පන්හිඳ මොකක්දෝ වැදගත් ලියවිල්ලකට දිනය දමමින් මුල පිරුවා.

''අළුත් අවුරුද්දක් ලැබුවා නේද යාළු?'' පින්සල පරණ දින දර්ශනය බිත්තියෙන් අයින් කරන ගමන් ඇහුවා.

''කොහොමත් අවුරුද්දක් ලබලා මාසයක් විතර යනකල් පරණ අවුරුද්දමයි දිනය ලිපනකොට ලියවෙන්නෙ....'' පත් තමන්ගේ වැරැද්ද සාධාරණීයකරණය කරන්නට උත්සාහ කළා.

''ඔව් ඉතින් යමක් කරන කොට තමන්ට හුරු පුරුදු පරණ දේවල් ඉස්මතු වෙන එක හොඳයි. දවසින් දවස ලෝකයත් එක්ක ඉස්සරහට යන ගමනේදී පරණ කියුම් - කෙරුම් එහෙමත් හිතේ තියාගෙන යනවා නම් තමයි වැඩියෙන් හොඳ ? පින් පණ්ඩිත වාක්‍යයක් වැදෑරුවා. කරන්න ගිය වැඩේ පැත්තක තියලා පන් පරණ ''සන්නස'' පත්තර මිරිය අවුස්සන්න ගත්තා.

''හිතේ හැටියට යමක් කරන්න ළඟපාත තැන් බෝම හිඟයි'' පන්ට ඉබේටම කියවුණා.

''අනං මනං බහුබූත නැතිව යමක් කරයි කියලා විශ්වාසයක් තියෙන්න ඕන. ඉතින් ඒකට ඉඩ දෙන්න'' පින්ගේ ඒ කියමනට පත් පොඩි කල්පනාවකට වැටුණා. හුරතලේට පුංචි පුංචි කව්, නිසදැස් ලියලා පටන් ගත්ත වැඩේ නේද මේ ගමනට මුල පිරුවෙ කියලා පන්ට සිහිවුණා.

''පත්තරවලට ලියන්න පන්ට රේඩියෝව හදලා දුන්න කව් සින්දු ගැන යමක් ලියන්න බැරිද මෙදා පාර?'' පින් ඇහුවේ විහිළුවට වාගේ.

''ඒකත් හොඳ අදහස. ඒත් ඉතිං මං මොනවද ඔය හැටි ඔය ගැන දන්නෙ?'' ''දන්න ටික හරි ලියලා දැම්මා නං?'' පින් ඇඟට නොදැනී කිව්වා.

සිංහල ගීත නැතහොත් සින්දු පිළිබඳව අපහට මුලින්ම අසන්නට දකින්නට ලැබෙන්නේ සීගිරි ගී වලිනි. සීගිරි ලලනාවන්ගෙන් වර්ණිකෘත වූ කලාකාමී සංචාරකයින් හා ආගන්තුකයින් විසින් කැටපත් පවුරෙහි ලියැවුණු මෙම ගී විවිධ තරාතිරම්වල රසිකත්වයන් ඇත්තන් විසින් පබැඳුන රචනා වූ හෙයින්ම විවිධ ස්වරූපයන් ගන්නා ලදී.

''1. සෙනෙවිරදුන් වහසෙගෙ

2. ඒ දැක අගනටප සිහිවන හිතිනි
වෙය සෙනෙ එහි රජාණන් වන් රන්වනිහන් එහි
එබස් රස ජනනෙ ගි කෙවලින් නොලියෙනයේ.

3. සෙත් රජැලි කින් රුව රස ගාලි''

අරුත : මෙය (සේන) රජුගේ යුද හමුදාවේ සෙනෙවිරදුන්ගේ (කවියයි) මේ රන්වන් කතුන් අපගේ හදවත් ආලයෙන් කුල්මත් කරවන රැජනන් වැන්න. ඔවුන් මනරම් වචන තෙපලන ඒට කවරෙකුට ගීයක් ලිවීමෙන් වැලකී සිටිය හැකිද?

('පුර අසිරිය', 'ශ්‍රී' සඟරාව 2004 මාර්තු කලාපය)

''ගීය'' යන්න හෙළ බස් වහරට එක්වන මුල්ම අවස්ථාවයි මේ.

''මුන්නැහේලාගේ ඇත්තටත් කව් - සින්දු ලියවිලා තියෙන්නෙ අපේ උදවිය ඇන්ද ලලනාවෝ දැක්කාමයි එහෙනං?''පන් කෙඳිරුවා 'ඒක විහිළුවක්ද? කිතිකවාගෙනවත් හිනාවෙන්න බලන්නංකෝ පස්සේ. මේකට හොට දාගෙන ඉන්නෙ නැතිව මොනවා හරි ඇන්දානම් හොඳ නැද්ද? මේවා ඉක්මණට ඇරියෙ නැත්තං කර්තු තුමා පරළ වෙයි ඔන්න''

ගීය අද වනවිට ස්වාධීන කලාවක් බවට පත්වූවද අන් සියලුම දේ මෙන්ම එහි මුල් අවස්ථා වූ කවිය අද වනවිටත් ඇතැම් නිර්මාණයන්ට සෙවනැල්ලක් වේ. ඒ නිසාම කිසිවිටෙක කවිය පසෙක ලා ගීය විමසිය නොහේ. කියැවීම, ලිවීම වැනි සාක්ෂරතාවයන් හීන වූ අතීතයේදී පවා සිංහල ජන කවියා තෙලුම් කව්, පැල් කව්, ගැල් කව්, පතල් කව්, පාරු වැනි කව් හඬ නඟා කිව්වේ ඉතාමත්ම හැඟුම් බර තාලවලටය. ඒ නිසාම ඒවා කිසියම් පිරිතකට නිර්මාණය වූ පදවලින් යුත් නිර්මාණ වූත් ස්වාධීන වූත් නිර්මාණ විය. විරිත යනු යම් මාත්‍රා ගණනකට අනුව ලියැවුණු පද වේ. නිශ්චිත මාත්‍රා ගණන නිසාවෙන්ම ආරෝපණය කෙරෙන කාලය එම කවිය ලියැවුණ විරිත වන්නේය. මාත්‍රාවක් යනු කාලය මනිනා ඒකකයකි. අසුරු සැණයක කාල නිමේෂය මාත්‍රාවකි. 'අ' යන්න කියැවීමට ගතවන්නේ එක් මාත්‍රාවක් වන අතර, ඒ නිසාම එය 'ලඝු' අක්ෂරයක් වන්නේය. 'ආ' යන්න සඳහා මාත්‍රා ගණන දෙකකි. අසුරු සැණ දෙකක කාලයක් ඇදෙන එවන් අකුරු 'ගුරු' අක්ෂරයන් වේ. ලඝු අකුරක් සමඟ හල් අකුරක් යෙදීමේදී ඒ දෙකම එක්කොට ගුරු අක්ෂරයක් ලෙස සංගීතයේදී ගණනය කෙරේ. සංගීතයේදී

යෙදෙන කාල වර්ග අනුව පදයක මාත්‍රා ගණන බිඳෙයි. ගීතයකින් අත්පුඩි ගසන්නේ තාලයටයි. අත්පුඩි දෙකක් අතර යෙදෙන මාත්‍රා ගණන ගීයේ විරිත අනුව තීරණය වේ. කවිහෝගී පද රචනා-වකදී ශබ්ද රසයද වැදගත් වන්නේ එය සවන පිනවන නිසාවෙනි. එහෙයින් සමාන ශබ්දය නැංවෙන අක්ෂර හෝ එකම අක්ෂරය පද අග යෙදීමට පැරැන්නෝ උක්සුක වූහ. සිය කවිත්වය විදහා දැක්වීමට මෙලෙස පදවල කීප පොළකම සම අක්ෂර ගැන්වීම සිරිතක් විය. එලෙස යෙදුන තැන් එළිවැට, එළිසමය, චන්දස් හෝ සදැස් නම් වේ.

තුන් දොස් දුරුර සිත මුහි පුදට සතුටුව
පින් රැස් කරන සදැහෙත් ඇමට පෙරටුව
නන් සස් කෙත් වතින් නිති සැදුණ නොපටුව
මන් තොස් කරව දැක වම් පසෙහි ගොතටුව

හංස සංදේශ කාව්‍යයෙහි එන මෙම කවියෙහි 'න්', 'ස්' සහ 'ව' අක්ෂරයන් යෙදීමෙන් කවිකාර දෙවන වීදාගම හිමිපාණන් වහන්සේ තුන් පළකම එළිසමය සුරැකි අතර, වඩාත් අලංකාර වන සේ කවියේ අග එළිසමය 'වුව' ශබ්දාලංකාරයෙන් ද හැඩ ගැන් වූ සේක.

මෙවැනි ජන්දස් නැතහොත් සදැස් වලින් තොරව කව් පබැඳින්නට මුල පිරූ නූතන කවියා ශබ්ද රසයන්ට වඩා අර්ථ රසය පිළිබඳව උනන්දු විය. ඒවා නිසදැස් නම් විය. කවිත්වයෙන් හීන වුවද නව චින්තනයන් එළිදැක්වීම පෙළැඹුණ වූ නිසදැස් ගායනීය ගුණයෙන් කවිය තරමට ආකර්ශනීය බවක් නොපෙන්වයි. එසේ වුවද සංගීතවේදීන්ගේ කුසලතාවය නිසාවෙන් හිමි වූ අපූරු ගීත කොටස්ය මේ.

මා මළ පසු සොහොන් කොතේ
දුක් ගීයක් ලියනු මැනව
නන්නාදුනනා ඔබගේ
අත් අකුරන් ලියනු මැනව ?

මහගම සේකරයන්ගේ රචනය සංගීතවත් කර ගැයුවේ පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයාණන් විසිනි.

තනි තරුවේ
ඔබත් ඔහොම ඔතන ඉන්න
මමත් මෙහෙම මෙතැන ඉන්නවා.....

ප්‍රේමකීර්ති ද අල්විස් රචකයණන් ගේ පද සංගීතවත් කොට ගායනා කළේ වික්ටර් රත්නායක ශිල්පියාණන් විසිනි. සුනිල් ආර්. ගමගේ රචකයාණන් විසින් රචිත 'කවිය ඔබ' නිසදැස දීපිකා ප්‍රියදර්ශනී විශාරදවරියගේ හඬින් ගීතවත් වූයේ රෝහණ වීරසිංහ ශිල්පියාණන්ගේ ස්වර රටා නිසාවෙනි.

නිසදැසට වඩා ගායනීය ගුණයන්ගෙන් යුත් කව් ගීත බවට පත්වූ නිදර්ශන බොහෝය. වික්ටර් රත්නායක සංගීතවේදීයාණන් අනිත් සංගීතවත්ව ගැයුණ මෙම ජනප්‍රිය ගීය ඩබ්.එම්.ඊ. බණ්ඩාර රචකයාණන් විසින් සමුදඝෝෂා විරිතට ලියැවුණ කවි පෙළක් නොවේද?

දෙතොලග සිත ආදර කැල්මෙන් නැහැවේ
පෙම් රස අනා අමුණායි සුන්දරතා වේ
නුවන්ග බැළුම් නිහඬව ගැයූ ගී රාවේ
මධුරස පිරේ සවිනත මීවිත යාමේ

සිංහල ජන කවියේ සහ ජන ගීයේ නාද රටා සාපුවම සිය නිර්මාණ වලට මුහු කර ගත් ශිල්පියෙකි මතුලොලුව ඇඳුරිඳුගේ මඟ ගත් ලයනල් රන්වල ශිල්පියාණන් ''මේ අවුරුදු කාලේ කිරි කොරහේ කව් නාද රටාවන් අනුව නැඟුණ තනුවට ජයතිස්ස බොරළුගොඩ රචකයාණන් විසින් පද යෙදුණකි. ජන කවිය තවදුරටත් විකාශනය වෙමින් නැංවූ ජන ගී වලට නිදසුන් කීපයකි වන්නම්, සවිදම්, නැලවීලි ගී, තුන් සරණේ ගී, විශාරද නන්දා මාලනීයගේ ගායන කුසලතාවය මෙන්ම නිර්මාණ කුසලතාවයද විදහා දැක්වෙන 'සාරි පොඩිත්තක්' ගී එකතුවද මෙහිදී අවධානයට ලක්වන්නේ ජන ගී නාද රටාවන් මූලික කොටගෙන ඇති නිසාවෙනි. 'කොටුපොළ අයිනේ' (මහාචාර්ය සුනිල් ආරියරත්න) ගී තනුව 'මලේ මලේ අර නාමල නෙලා වරෙන්' පාරු කව්යෙන් ද 'ආදරයේ උල්පත වූ අම්මා' ගි තනුව 'දොයි දොයි දොයි දොයිය බබා' නැළවීලි ගීයෙන් ද ආභාෂය ලැබූ අන්දම එම ජනකව්, ජන ගී ගයමින් වික්ටර් රත්නායකයන් පැහැදිලි කරන්නේ අපගේ මුල් ජන කවියාට කෙරෙන බුහුමනක් වශයෙන් නොවන්නේද?

ගීතය නිම්වලලු පුළුල් කෙරෙමින් විකාශනය වීමේදී ඊට පැනවුණ ප්‍රධානම සීමාව වූයේ කාලයයි. එය හුදෙක් වාණිජත්වයෙන් යට වූ මාධ්‍යන් විසින් සහ නැවුම් නිර්මාණ හංගත්වයෙන් යුත්තවූවන්ගේ අවශ්‍යතාවයන්ට අනුව වූවක් පමණක්මය. තෙවරක් ගැයෙන ස්ථායි කොටසකින් හා දෙපොලක ගැයෙන අන්තරා දෙකොටස අතරෙහි මොනවා හෝ සංගීත මෙවලම් හඬක් රිංගවා පිරිනැමීම රසිකයාගේ රසිකත්වය නිගාවක් නොවන්නේද?

සේකරයන් විසින් රචිත 'සිනිඳු සුදු මතු තලාවේ' සහ 'අඩවන් දැසින්' ගීත පණ්ඩිත් අමරදේවයන් සහ වික්ටර් රත්නායකයන් හඬින් සිනමාපට දෙකක් සඳහා සෝමදාස ඇල්විටිගල සංගීතවේදියාණන් විසින් ගායනා කරවනලද්දේ 'අලුත් දෙයක් කරමු' යි මැත දොඩමින් එකතැනම පල්වෙන පඬිවරනට යස පාඩම් කියා දෙවමිනි. කාල සීමා, ගීත සැලකිල්ලෙහි සීමා කඩා බිඳ ගිය මෙම ගීවල අන්තර් වාදන සහ අන්තරා කොටස් ගැයෙන්නේ එකිනෙකට වෙනස් වූ තනු වලටය. ගායනීය නොවූ අක්ෂරයන් වූ 'ත', 'ථ', 'ද' වැනි අක්ෂරයන්ගෙන් ගහණ 'කතරට කුමට ද වසන්තයක්?' (ප්‍රේමකීර්ති ද අල්විස්) සිය සංගීතවත් කොට ගනිමින් රත්නායකයන් ගිතය පිළිබඳව වන ඇතැම් බමුණු මතයන්ද පළවා හැරියා සේය. මේ සියලු නව නිමිඃ-වුම් අතරින් වඩා බලන නිර්මල ජන කව් ගී හඬ අමතක කළ යුතු නොවන්නේ එය ගීයේ මුල වූ නිසා වෙනි. මිනිස් හැඟීම් ස්පර්ශ කළ හැකිවන්නේ හදවතට ඇමතීමෙන් පමණකි අපගේ දේ පිළිබඳව ලේ නහරවලට කැපී තැන්පත්ව ඇත්තේ පාතුවතින්ම නැගෙන හැඟීම්වල විනා ආයාසයෙන් වඩාගත් බුද්ධියේ නොවේ. අද දරුවකු සිය මව අමතන සුදෝ සුදු කම් පන්තිය අදාල තාලයකට ගැයීමේදී අපගේ නෙතඟ කඳුලක් නැංවෙන්නේ ඒ නිසා නොවේද?

මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා
පෙනෙනවා දකිනවා කියනා ඒවා
මොනවද අම්මෙ මා අහගන්නට ආවා
තෝරා දෙන්න මා දන්නෙ නෑ මේවා

පන් තමන්ගේ අදහස් ඔය විදියට ගොනු කළා.

මාස දොළහක සතුටක්, සති පනස් හතරක සැනසීමක්, දින තුන්සිය හැට පහක නිරෝගී බවත් ලැබූ දෙදහස් සය නව වසරේදී පාඨක ඔබසැමට ළඟාවේවා ? යි පැතුමෙන් පින් එම වර්ෂයට පිවිසුමත් එය පිළිඟැනෙනා අර්ථයන් දෙමින් මකර තොරණක් ඇන්දා. ■